


1. කිරි වතුරේ දිය නොවන්නේ යයි කිව්වොත් ඔබ පිළි ගන්නේද? ඇත්තෙන්ම කිරි වතුරේ දිය නොවේ. කිරි වල 87% පමණ අඩංගු වන්නේ වතුරයි. ඉතිරිය එනම් මේද, හා මේද නොවන අනෙකුත් කොටස් පවතින්නේ වතුරේ අවලම්බනයක් වශයෙනුයි. එනම් මේවා පවතින්නේ වතුරේ විසිරී ඇති ඉතා කුඩා අංශුමය ප්‍රමාණයන් ගෙන් නිසා අපට ඒවා වතුරෙන් වෙන් වී පෙනෙන්නේ නැත.

2. මුලු මහත් ලෝකයේ වෙසෙන මනුෂ්‍යයින් සංඛ්‍යාවට වඩා කුකුලන් සංඛ්‍යාවක් ඇමෙරිකා එක්සත් ජනපදයේ කුකුළු පට්ටිවල ඇති කරන බව ඔබ දන්නවාද?

3. එළුකිරිවල, එළකිරි වලට වඩා 7-10 පමණ ගුණයකින් යකඩ වැඩිපුර අඩංගුවේ. එළුකිරි වලට 5%ක් ලැක්ටෝස් සීනි එක් කිරීමෙන්, එය මනුෂ්‍ය කිරි වල සංයුති යට බොහෝ සෙයින් සමාන වේ.

4. කිරි දෙනකු නිෂ්පාදනය කරන කිරි ප්‍රමාණය, එම දෙනගේ තන බුරුල්ල තුලින් ගමන් කරන රුධිරය ප්‍රමාණය හා කිට්ටු සම්බන්ධතාවයක් දක්වයි. සාමාන්‍යයෙන් නීරෝගි කිරිදෙනකුගේ බුරුල්ල තුලින් පැයකදී රුධිරය රාත්. 200 ක් පමණ ගමන් ගනී.

5. බිත්තර කටුවේ ඇතුලත ස්ථරය මගින්, එය තුල වැඩෙන කුකුළු පැටවාගේ ඇටකටු වලට අවශ්‍ය කැල්සියම් සපයන බව ඔබ දන්නවාද?

6. ලෝකයේ විශාලතම වශයෙන් රනිල බෝග වගාකරන රට ඉන්දියාව වේ. ඉන්දියාව තුල රනිල බෝග වගාකර ඇති වපසරිය හෙක්ටයාර් දෙකෝටි හතලිස් ලක්ෂයක් (1 හෙක්.=අක්. 2.5) පමණ වේ. මෙම වපසරිය, ජපානය, ඉන්දුචීනය, ශ්‍රී ලංකාව, තායිලන්තය, කොරියාව සහ මලයාසියාව යන රටවල සියලුම වර්ගවල බෝග වගාකර ඇති මුළු වපසරියටත් වඩා වැඩිය.

* * *


3—ඒ 20000 (4/76)

වෙනස සොයන්න ගුරු චිත්‍රය.




හොර චිත්‍රය.

